# අනුකරණ ක්‍රියාවලිය සඳහා අභිනය භාවිත කිරීම

නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරන මාධ්‍ය අභිනය නම් වේ. ඉවතට හෙවත් භාහිරට පැමිණවීම මෙම වචනයේ අර්ථයයි. එනම් ප්‍රේක්ෂකයා වෙත යම් කතා පුවතක් ගෙනයාම අභිනය නම් වේ.

අභි = ඉදිරියට

නය = ගෙනයාම

අභි + නය = ඉදිරියට ගෙන යාම



අභිනය සතරාකාර වේ.

- වාචික අභිනය
- ආංගික අභිනය
- සාත්වික අභිනය
- ආහාර්ය අභිනය

## ➤ වාචික අභිනය

ප්‍රබල අදහස් ප්‍රකාශන මාධ්‍ය වාචික අභිනයයි. පිටපතක අන්තර්ගත දෙබස්, සංවාද, ගීත ආදිය නළුවකු විසින් යම් අදහසක් ඉස්මතු වන පරිදි ඉදිරිපත් කිරීම වාචික අභිනයයි.

උදා :

- පූසා : බලුරාළේ බලුරාළේ
  බලුරාල : ම්ම්ම්
  පූසා : එලිවෙලා කුරුල්ලෝ කෑගහනවා

- ඇහැළ මලින් ගස් පිරිලා බලන්න හරි ලස්සනයි
  අඹ රඹුටන් ජම්බු ඉදිලා අද හැමතැන හරි හැඩයි

## ➢ සාත්වික අභිනය

පිටපතක අන්තර්ගත යම් චරිතයක මනෝභාවයන් මුහුනේ ඉරියව් මගින් ඉදිරිපත් කිරීමයි.

| | |
|---|---|
| සතුට | සැකය |
| දුක | පුදුමය |
| පිළිකුළ | වෛරය |





## ➢ ආංගික අභිනය

පිටපතක අන්තර්ගත චරිතයක යම් යම් ස්වාභාවයන් නළුවාගේ ශරීරයේ අංග ප්‍රත්‍යාංග හා උපාංග මගින් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමයි.

| අංග | ප්‍රත්‍යාංග | උපාංග |
|---|---|---|
| හිස | උරහිස | ඇස |
| අත් | බාහු | කම්මුල් |
| පපුව | පිට | නිකට |
| දෙපා | උදරය | මුහුණ |
| | කෙණ්ඩා | හක්ක |
| | | තොල් |



උදා :   අතපය සෙලවීම


හස්ත මුද්‍රා



- ➢ ආහාර්ය අභිනය

පිටපතක ඇතුළත් විවිධ අවස්ථා නිරූපණය කිරීමට බාහිරින් යොදාගන්නා අනුෂාංග මේ නම් වේ. මෙහි පිටතින් ගෙන එනු ලබන යන අර්ථය ආහාර්ය යන්නෙහි අදහසයි. නළුවාට රංගය වඩාත් තීව්‍ර කරගැනීමට මෙයින් හැකි වේ. මෙකී අනුෂාංග මගින් නාට්‍යක නළු නිළියන් විසින් රග දක්වන රංගය වඩා තීව්‍ර කරමින් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. ආහාර්ය අභිනයට අයත් අංග ලෙස,

- අංග රචනය
- රංගාලෝකය
- රංගභූමි අලංකරණය
- වේෂ භූෂණ
- රංග වස්ත්‍ර
- රංග උපකරණ







පැවරුම :  ඔබ නැරඹූ වේදිකා නාට්‍යයක අභිනය භාවිත කර ඇති ආකාරය පැහැදිලි කරන්න